# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1867/21 - 2014 ජුනි මස 20 වැනි සිකුරාදා - 2014.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/2013.

**(276 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සහා ආඥාපනත**

(276 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සහා ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ වූ අධිකරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදනු ලබන රීති.

සංස්ථාගත නීති අධ්‍යාපන සභාව,<br>(සංස්ථාගත නීති අධ්‍යාපන සභාව සඳහා<br>සහ වෙනුවෙන් අත්සන් කරන ලදී.)

2014 මැයි මස 07 වැනි දින,<br>කොළඹ දී ය.

රීති

1. නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලැබ, වරින් වර සංශෝධනය කරනු ලැබූ රීති, එහි 23 වන ඡේදයේ (2) වන අනුඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීම මගින්, වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(*අ*) එහි (ii) හා (iii) වන අනුඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :-

‘‘(ii) ප්‍රවේශ විභාගය සඳහා වන විෂය වනුයේ :-

(*අ*) භාෂා ප්‍රශ්න පත්‍රය - සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව ; සහ

(*ආ*) සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය ;’’;

‘‘(iii) යම් අපේක්ෂකයකුට සාමාන්‍ය දැනීම හා සාමාන්‍ය බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය සඳහා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පිළිතුරු සැපයීමට තෝරා ගත හැකිය. සාමාන්‍ය දැනීම හා සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය සඳහා සිංහල හෝ දෙමළ භාෂාවෙන් පිළිතුරු සැපයීමට ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සැපයිය යුතු ය. සාමාන්‍ය දැනීම හා සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් පිළිතුරු සැපයීමට ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු සිංහල භාෂා ප්‍රශ්න පත්‍රය හෝ දෙමළ භාෂා ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සැපයිය යුතු ය ;’’;


1A - PG 2081 — 350 (2014/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) එහි (vii) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් -

‘‘(vii) සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව සහ නීති ප්‍රවේශ විභාගයේ දී අපේක්ෂකයන් විසින් දක්වනු ලබන කාර්ය සාධනය මත පදනම් වූ කුසලතා අනුපිළිවෙල අනුව ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා අපේක්ෂකයන් තෝරා ගනු ලැබිය යුතු ය.

එසේ වුවද, ඉහත ප්‍රශ්න පත්‍ර දෙකම සඳහා සියයට හැටකට වඩා අඩු සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් හා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා උපරිම ලකුණු ප්‍රමාණය සියයට පනහකට අඩුවෙන් ලබා ගන්නා කිසිදු අපේක්ෂකයකු ඇතුළත් කර ගැනීම සඳහා තෝරාගනු නොලැබිය යුතු ය ;’’ ;

(ඇ) එහි (ix) හා (x) අනුඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් -

‘‘(ix) භාෂා ප්‍රශ්න පත්‍රය සඳහා විෂය මාලාව පහත පරිදි විය යුතු ය :-

(අ) අපේක්ෂකයකුගේ සිතීමේ, ප්‍රකාශ කිරීමේ හා සංවිධාන හැකියාව පරීක්ෂා කර බැලීම මූලික අරමුණ ඇතිව රචනාවක් ;

(ආ) සාරාංශකරණය සහ භාවිතාර්ථය දැක්වීම ;

(ඇ) පද වින්‍යාසය, වාග් මාලාව, සමාන පද හා විරුද්ධ පද, රූපක හා වාග් සම්ප්‍රදායානුකූල භාවිතයන් ;

(x) එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට වෙන්කර ඇති කාලය පැය තුනකි ;’’.

2. ඉහත සංශෝධන 2014 ජනවාරි මස 1 වන දින බලාත්මක වූ බවට සලකනු ලැබිය යුතු ය.

07 - 178

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.